VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# කාන්තාවන් අධ්‍යාපනයේ නිසි ඵල ලබා ගැනීමට සමත් වී ඇතිද?


ආර්ථික විද්‍යාත්මක පර්යේෂණ සහ න්‍යායන් මගින් අධ්‍යාපනය තුළින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ඉතා පැහැදිලි විග්‍රහයන් ඉදිරිපත් කෙරේ. එනම්, අධ්‍යාපන මට්ටම, රැකියාවන් සහ ආදායම් මට්ටම් සමග ධනාත්මක සම්බන්ධතාවයක් දක්වන බවයි.

නමුත් ශ්‍රී ලංකාව තුළ මෙම ධනාත්මක සම්බන්ධතාවය බිඳ වැටී ඇති අතර ඉන් බලපෑමට ලක් වී ඇත්තේ ස්ත්‍රී පාර්ශවයයි. ශ්‍රී ලංකාව ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව පැහැදිලි සාර්ථකත්වයක් අත් කර ගැනීමට සමත් වුවද එය සාර්ථක සේවා නියුක්ති තත්ත්වයක් දක්වා වර්ධනය කරගැනීම අභියෝගයක් බවට පත්ව ඇත. පසුගිය කාලය තුළ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පහළ වැටී අතර උගත් ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ සේවා නියුක්ති තත්ත්වය තුළ ද පැහැදිලි පරතරයක් දක්නට ලැබේ.

## ස්ත්‍රී අධ්‍යාපනයේ වැදගත්කම

ශ්‍රී ලංකාව ස්ත්‍රීන්ගේ අධ්‍යාපනය සහභාගීත්වය පිළිබඳව ඉහළ සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට සමත් වූ රටකි. ප්‍රාථමික අධ්‍යාපනය සහභාගීත්ව අනුපාතයන් තුළ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම එක හා සමාන තලයක පසුවන අතර ඉහළ අධ්‍යාපනය සාධන මට්ටම තුළ ස්ත්‍රීන් පුරුෂයන් අභිබවීමට සමත් වී ඇත . මෙම නැඹුරුව වර්තමානයේදී ද ක්‍රියාත්මකව පවතී (රූප සටහන 01). උදාහරණයක් ලෙස 2010 වර්ෂයේදී උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂිකයින්ගෙන් 58% ක් කාන්තාවන් වූ අතර විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූවන්ගෙන් 67% ක් පමණ ඉහළ ප්‍රතිශතයන් තමන් සතු කර ගැනීමට කාන්තාවන් සමත් විය.

**රූප සටහන 01 :** අධ්‍යාපන මට්ටම - ස්ත්‍රී පුරුෂභාවය අනුව (වයස අවුරුදු 5 ට වැඩි ජනහගහනයෙන් ප්‍රතිශතයක් ලෙස)





මූලාශ්‍රය : ජනගහන සමීක්ෂණය (2012) - ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

මෙම අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඒ ආකාරයෙන්ම සේවා නියුක්තිය තුළ ද දක්නට නොලැබේ. කාන්තාවන් අධ්‍යාපනය තුළ (ද්විතීක මට්ටමේදී) පුරුෂයින් අභිබවලීමට සමත් වුව ද ශ්‍රී ලංකා ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්ව අනුපාතය 30% ක පමණ අඩු අගයක් ගනී. එමෙන්ම මෙම අනුපාතය පසුගිය කාලය තුළ අඩු වීමේ ප්‍රවණතාවක් ද පෙන්වා තිබේ. එපමණක් නොව මෙම අනුපාතය ආසියාතික කලාපයේ අනෙකුත් තරගකාරී රටවල් වලට සාපේක්ෂව ද අඩු මට්ටමක පවතී. නමුත් මීට පරස්පර ලෙස ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම සහභාගීත්ව අනුපාතය 67% ක් පමණ ඉහළ අගයක් ගනී. මින් ගම්‍ය වන්නේ ශ්‍රම බලකාය තුළ සිටින සෑම කාන්තාවන් 10 දෙනෙකුගෙන්ම තුන් දෙනෙකු රැකියා සෙවීම සඳහා උනන්දුවක් දක්වද්දී මීට සාපේක්ෂව පුරුෂයින් 10 කින් හත් දෙනෙකු පමණ රැකියාවක සෙවීම සඳහා උනන්දුවක් දක්වන බවයි.


ඉහළ අධ්‍යාපන තලය තුළ රැකියා නියුක්තියේදී කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂයින්ට වැඩි අවස්ථාවන් ලැබීම නිසා ඉහත කරුණ තවත් ගැටළුකාරී මට්ටමක පවතී. රූප සටහන 02 මගින් දක්වා ඇති දත්ත වලින් පෙනී යන්නේ පුරුෂයින්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාමත් සමග ඔවුන්ගේ රැකියා වියුක්ති ප්‍රතිශතය පහළ යන බවයි. නමුත් ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාමත් සමග ඔවුන්ගේ රැකියා විරහිත භාවය ද ඉහළ ගොස් ඇත. පසුගිය දශකය තුළ මෙම ගැටළුව තවත් තීව්‍ර වී ඇත. එනම් 2002 සහ 2012 කාල පරාසය තුළ උසස් පෙළ මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ඇති කාන්තාවන් සහ පුරුෂයන් අතර පවතින සේවා නියුක්ති පරතරය 5.9% කින් පමණ ඉහළ ගොස් ඇත (රූප සටහන 03).

**රූප සටහන 02 :** සේවා වියුක්තිය - අධ්‍යාපන මට්ටම අනුව




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව -ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය - 2012

**රූප සටහන 03 :** රැකියා වියුක්තිය - උසස් පෙළ සමත් හා ඉහළ අධ්‍යාපන මට්ටම




මූලාශ්‍රය : ජනලේඛණ හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව -ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය - 2012

## ඉල්ලුම සහ සැපයුම අතර නොගැලපීමක්

ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය අඩුවීමටත් උගත් ස්ත්‍රීන්ගේ රැකියා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීමටත් කරුණු කිහිපයක් බලපෑ හැකිය. මෙම විශ්ලේෂණය තුළ ඉදිරිපත් කරන දත්ත මගින් ස්ත්‍රී පුරුෂ සේවා නියුක්යෙහි විෂමතාවන් පවතින අවකාශයන් දෙකක් පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරේ. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය තුළ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විශාල පරතරයක් පවතින අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් හා පුරුෂයින් ලබා ගන්නා නිපුණතාවයන් වල ද විශාල වෙනස්කම් පවතී.


2012 වර්ෂයේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයන් තුළ නිර්මාණය වූ රැකියාවන් අතර පවතින ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වු පරතරය කැපී පෙනේ. 2012 දී රාජ්‍ය අංශය මගින් 42,234 ක පමණ රැකියා අවස්ථාවන් කාන්තාවන්ට ලබා දුන් අතර (පෙර වර්ෂයට සාපේක්ෂව) පෞද්ගලික අංශයේ ස්ත්‍රී සේවා නියුක්තිය 10,037 ක පමණ රැකියා කප්පාදුවක් සිදු කරන ලදී (රූප සටහන 04).

2012 දී රාජ්‍ය අංශය තුළ ලබා දුන් රැකියා වලින් 83% ක පමණ ප්‍රතිශතයකට හිමිකම් කියන ලද්දේ කාන්තාවන් ය. ශ්‍රී ලංකාව තුළ ඇති රැකියා වලට ඉහළම දායකත්වයක් ලබා දෙන්නේ පෞද්ගලික අංශය යි. එනම් 40% ක් පෞද්ගලික අංශය සහ 15% ක් රාජ්‍ය අංශය ලෙසිනි. නමුත් රැකියා අවස්ථා සඳහා පෞද්ගලික අංශයට වඩා අඩු දායකත්වයක් ලබා දෙන රාජ්‍ය අංශය තුළ කාන්තාවන්ට රැකියා අවස්ථාවන් සඳහා වැඩි දායකත්වයක් ලබා දේ.

මේ අනුව රාජ්‍ය අංශය ස්ත්‍රී පුරුෂ රැකියා අවස්ථාවන් සඳහා යම්කිසි සමානාත්මතා පදනමකින් යුතුව ක්‍රියා කරයි. රාජ්‍ය අංශය තුළ රැකියා නියුක්තියන්ගෙන් 57% ක් පුරුෂ පාර්ශවය වන අතර 43% ක් ස්ත්‍රී පාර්ශවය වේ. නමුත් පෞද්ගලික අංශය තුළ ස්ත්‍රී පුරුෂ සේවා නියුක්තිය

අතර විශාල වෙනසක් තිබේ. එනම් පෞද්ගලික අංශයේ පුරුෂ සේවා නියුක්තිය 71% ක් පමණ වන විට කාන්තා සේවා නියුක්තිය 29% ක් වැනි කුඩා අගයක් ගනී. මේ ආකාරයට 2012 දක්නට ලැබෙන විෂමතාවය ඉදිරියේදී ද ක්‍රියාත්මක වුවහොත් පෞද්ගලික අංශයේ ස්ත්‍රී පුරුෂ රැකියා පරතරය තවත් පුළුල් වනු ඇත.

**රූප සටහන 04 :** රාජ්‍යය හා පෞද්ගලික අංශය තුළ නිර්මාණය වූ නව රැකියා ප්‍රමාණය - 2012




මූලාශ්‍රය : ජනලේඛණ හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව -ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය - 2012

සේවා නියුක්ති පරතරය සම්බන්ධ දෙවැනි කරුණ, එනම් නිපුණතාවය දෙසට අවධානය යොමු කරමු. අධ්‍යයන උසස් පෙළ සමත් වීම සම්බන්ධ ස්ත්‍රීන් පුරුෂයින්ට වඩා ඉහළ සාර්ථකත්වයක් අත් කරගැනීමට සමත් වුව ද උසස් පෙළ සඳහා අධ්‍යාපනය හැදෑරීමේදී ස්ත්‍රීන් කලා අංශයේ විෂයයන් හැදෑරීමට වැඩි නැඹුරුතාවයක් දක්වයි. උදාහරණයක් ලෙස ශිෂ්‍යාවන්ගෙන් 59% ක් වැනි ඉහළ ප්‍රතිශතයක් උසස් පෙළ සඳහා කලා අංශයෙන් පෙනී සිටින අතර ශිෂ්‍යයන් තුළ මෙම අගය 40% ක් පමණ වේ.

එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරන ලද අධ්‍යයන මගින් පෙනී යන්නේ කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති මට්ටම 31.5% ක් පමණ වන බවයි. මෙය වාණිජ්‍යය (65%), කෘෂිකර්මය (69.5%), වෛද්‍ය (89.9%) ක් හා ඉංජිනේරු (95.1%) උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතයන්ට සාපේක්ෂය ඉතා අඩු අගයක් ගනී.

මේ අනුව පෞද්ගලික අංශය තුළ පවතින ස්ත්‍රී පුරුෂ රැකියා පරතරය හා නිපුණතා මට්ටම ශ්‍රම බලකාය තුළ ස්ත්‍රී සහභාගීත්වය අඩු වීමටත් උගත් ස්ත්‍රීන්ගේ සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීමටත් බලපෑ හැකිය. මීට අමතරව අනෙකුත් සමාජ ආර්ථික මෙන්ම සංස්කෘතික සාධක ද මේ සඳහා බලපානු ලැබේ.

## උගත් ස්ත්‍රීන් සඳහා රැකියා අවස්ථාවන් සුලබ කිරීම

දියුණු වෙමින් පවතින අනෙකුත් රටවලට සාපේක්ෂව ස්ත්‍රීන් සඳහා අධ්‍යාපන අවස්ථා ලබා දීමේදී ශ්‍රී ලංකාව සාර්ථකත්වයක් අත් කර ගැනීමට සමත් වී ඇත. නමුත් මෙම ජයග්‍රහණය ශ්‍රම වෙළඳපොල තුළ කාන්තා සහභාගීත්වය දියුණු කර ගැනීම ස්ත්‍රී ශ්‍රම සහභාගීත්ව අනුපාතය අඩු මට්ටමක පවතිනවා පමණක් නොව තව දුරටත් අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්වා ඇත. තව ද උගත් ස්ත්‍රීන් අතර පවතින රැකියා වියුක්තිය ද ඉහළ අගයක් ගනී.

ශ්‍රී ලංකාව වර්තමාන ශ්‍රම වෙළඳපොල තුළ නිපුණතාවයන්ගෙන් යුතු ශ්‍රමිකයන්ගේ හිඟයකට මුහුණ පා ඇති අතර ඒ නිසාම මෙවැනි ප්‍රවණතාවයන් වර්ධනය වීම වළක්වා ගත යුතු වේ. ශ්‍රී ලංකාව කාන්තා ශ්‍රම සහභාගීත්ව අනුපාතය දියුණු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ගත යුතු අතර ම උගත් කාන්තාවන්ගේ රැකියා නියුක්තිය වර්ධනය කර ගැනීම සඳහා ද ක්‍රියා කළ යුතුය.

පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිය තුළ පුරුෂයින් සඳහා දක්නට ලැබෙන පක්ෂපාතීභාවය මෙම අංශය කාන්තාවන්ට සේවා නියුක්ති අවස්ථා ලබාදීමට දක්වන පසුබටභාවයේ හෝ කාන්තාවන් පෞද්ගලික අංශයේ සේවය කිරීමට දක්වන පසුබට බවේ හෝ එම කරුණු දෙකේම සම්මිශ්‍රනයක් විය හැකිය. කලා අංශයේ උපාධිධාරීන්ගෙන් බහුතරයක් කාන්තාවන් වේ. කලා උපාධිධාරීන්ගේ අඩු සේවා නියුක්භාවය එම අංශය තුළ විශාල ස්ත්‍රී උපාධිධාරීන් සංඛ්‍යාවක් සිටීම ඔවුන් ලබාගන්නා අධ්‍යාපන විෂයයන් හි ස්වභාවය හෝ එම කරුණු දෙකෙහි ම ප්‍රතිඵලයක් විය හැකිය.

මෙම විශ්ලේෂණය මගින් ස්ත්‍රී අධ්‍යාපන මට්ටම සහ රැකියා වියුකතිය අතර පරතරය පිළිබඳ ගැටළුව හා ඒ සඳහා බලපෑ හැකි කරුණු ඉදිරිපත් කෙරේ. නමුත් මෙම ගැටළුව සඳහා සැබෑ පිළිතුරක් සොයා ගැනීම සඳහා තවත් අධ්‍යයන කිරීම කළ යුතුය. ආර්ථිකය සහ ස්ත්‍රීන් අධ්‍යාපනය සඳහා දරන ආයෝජනයන්ගෙන් සාධාරණ ප්‍රතිලාභ ලැබීම තහවුරු කර ගැනීම සඳහා ස්ත්‍රීන්ට ආර්ථික කටයුතු තුළ නියැලීමට පවතින බාධාවන් ඉවත් කිරීමට ක්‍රියා කළ යුතු වේ.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් insights@veriteresearch.org වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**